# කෙටියෙන්....

ද්වීධ්‍රැව රෝගය යනු වරින් වර මතුවන මානසික රෝගයකි.

රෝගය යටපත්ව ඇති කාලවලදී රෝගියා සාමාන්‍ය ලෙස සිටින අතර  රෝගය මතු වෙන  කාලවලදී දැඩි රෝග ලක්ෂණ පෙන්නුම් කල හැක.

මෙම රෝගයට ඇති එකම හා සාර්ථකම ප්‍රතිකාර ක්‍රමය ඖෂධ වේ.

නිසි ඖෂද වෛද්‍ය අවවාද පරිදි නොකඩවා ගැනීමෙන් සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට හැක.

මේ සඳහා ඕනෑම රජයේ රෝහලක මානසික සෞඛ්‍ය සායනයකින් ආධාර ගත හැක.

සැකසුම: වෛද්‍ය මේධානි හේවාගම

**Further Information**
[www.slcpsych.lk](http://www.slcpsych.lk)
contactslpsych@gmail.com
**Find us on**

**Prepared by:**

# ද්වීධ්‍රැව රෝගය (බයිපෝලර් රෝගය)

## BIPOLAR AFFECTIVE DISORDER



**Sri Lanka College of**

# හැදින්වීම

- ද්වීධ්‍රැව රෝගය නොහොත් බයිපෝලර් රෝගය පුද්ගලයකුගේ ජීවිත කාලය තුල වරින් වර මතුවන මානසික රෝග තත්වයකි.

- තම පවුලේ උග්‍ර මානසික රෝග ඇති වෙනත් සාමාජිකයන් සිටින්නේ නම් මෙය ඇතිවිය හැකි ප්‍රවනතාව වැඩිය.

- මෙම රෝගය නිසි ප්‍රතිකාර ලබා ගැනීමෙන් සාර්ථකව පාලනය කල හැකි අතර සාමාන්‍ය ජීවිතයක් ගතකිරීමට, එනම් විවාහ වීමට, දරුවන් ලැබීමට, වැඩි දුර ඉගෙනීමට හෝ සාර්ථක වෘතියක් පවත්වා ගැනීමට මෙය බාධාවක් විය යුතු නැත.

# රෝග ලක්ෂණ

- ද්වීධ්‍රැව රෝගය එකිනෙකට ප්‍රතිවිරුද්ධ ආකාර දෙකකට පෙන්නුම් කළහැක. එනම්, විටකදී මේනියා(mania) තත්වයද තවත් විටකදී විශාදය(depression) තත්වයද ලෙසය.

- රෝගයේ ලක්ෂණ, මතුවී සති හෝ මාස කිහිපයක් නොකඩවා පැවත නැවත යටපත්වන අතර **රෝගය පවතින කාලය තුල රෝගියාට තමන්ගේ සිතුවිලි හෝ ක්‍රියාවන් පිලිබඳ පාලනය අවම වේ.** ද

- මෙම ලක්ෂණ ඉතා තීව්‍ර වන අතර **පැහැදිලිවම රෝගියාගේ සාමාන්‍ය ගති පැවතුම් වලින් වෙනස් වේ.** ඒවා නිසා ඔහුට/ඇයට තමාගේ එදිනෙදා වැඩ කටයුතු වල යෙදිමට නොහැකිවී පවුල හෝ සමාජය තුල ගැටුම් ඇති වෙයි.

| **මේනියා** | **විශාදය** |
|---|---|
| • අධික සතුට | • අධික දුක සහ කලකිරීම |
| • අධික තරහ | • ජීවිතයේ වින්දනයක් නැති බව හැඟීම |
| • සිතුවිලි වේගවත්ව ගලා ඒම | • කායික දුර්වකතාවය |
| • වේගවත් කථනය | • සමාජශීලීබව අඩුවීම |
| • අධික්‍රියාකාරීබව | • ක්‍රියාශීලීබව අඩුවීම |
| • ආවේගශීලීබව නිසා අවදානම් ක්‍රියාවල යෙදීම - (අධික වියදම, අඬදබරවලට යොමුවීම, ලිංගික ආශාවන් අනුව නුසුදුසු ලෙස ක්‍රියාකිරීම,වැඩිපුර මත්පැන් /මත්ද්‍රව්‍ය භාවිතය) | • ඍනාත්මක සිතුවිලි |

- නින්ද සහ කෑම රුචිය වෙනස්වීම මෙන්ම දැඩිව එල්බගත් විවිධ අසාමාන්‍ය විශ්වාස ඇතිවීම සහ ඒ අනුව ක්‍රියාකිරීම මේනියා සහ විෂාදය තත්ත්ව දෙකෙහිදීම දැකිය හැකි පොදු ලක්ෂණයක් වේ. .
- 

# ප්‍රතිකාර

- **ද්වීධ්‍රැව ආබාධයට ඇති එකම සාර්ථක ප්‍රතිකාර ක්‍රමය නිසි ඖෂධ භාවිතයයි.**

- **ඖෂධ රෝග ලක්ෂණ සමනය කිරීමට මෙන්ම නැවත මතුවීම වැලැක්වීමටද යොදා ගැනෙයි.**

- ප්‍රථමව මානසික රෝග පිලිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිවැරදිව රෝග විනිශ්චය හා ඖෂධ නියම සිදු කල යුතුය.

- දෙවනුව නියම කරන ඖෂධ නිවැරදිව හා නොකඩවා ගත යුතුය.

- මෙම ආබාධයට විවිධ ඖෂධ වර්ග ඇති අතර රෝගියාට භාවිතා කිරීමට සතුටු සහ සුදුසු ඖෂද වර්ග හා ප්‍රමාණ වෛද්‍යවරයා සමග සාකච්චා කොට තීරණය කල හැක.

- නිසි ඖෂධ භාවිතා නොකළහොත් මෙම රෝගය නැවත නවත හිස ඔසවන අතර එසේ වුවහොත් සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට එය බාධාවක් වනු ඇත.